චක්‍රලේඛ අංක : 77(ii)

අපේ අංකය: සං/01
කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය,
අංක:70, පාර්ලිමේන්තු පාර,
පැලවත්ත,බත්තරමුල්ල
2021.02.26

සියළුම ප්‍රාදේශීය කළමණාකරුවන් වෙත,

**තේ වගා ඉඩම් මැණුම් කටයුතු සිදු කිරීම සඳහා ගෝලීය ස්ථානගත කිරීමේ පද්ධතිය (GPS) භාවිතා කිරීම**

GPS තාක්ෂණය යොදා ගනිමින් ඉඩම් මැනීමට අදාලව නිකුත් කරන ලද 2018.08.21 දිනැති චක්‍රලේඛ අංක 77 හා 2018.09.27 දිනැති චක්‍රලේඛ අංක 77(i) ට වැඩිමනත්වයි.

ඒ අනුව GPS යන්ත්‍රය අක්‍රියවීම හෝ ස්ථානීය වශයෙන් මෙම තාක්ෂණය උපයෝගී කර ගැනීමට නොහැකි වන අවස්ථා වලදී පමණක් හැර අනෙකුත් සියළුම අවස්ථාවන්හිදී ඉඩම් මැනීමේ කටයුතු සඳහා GPS යන්ත්‍ර භාවිතා කිරීම GPS යන්ත්‍ර සපයා දී ඇති සියළුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්ට අනිවාර්ය වේ.

**GPS යන්ත්‍ර වල නඩත්තු කටයුතු**

ඉඩම් මැනීමේ කටයුතු වලදී GPS යන්ත්‍රය අක්‍රිය තත්ත්වයට පත්වී හෝ එහි මිණුම් සදොස්ව පවතී නම් ඒ බව ඉතා කඩිනමින් අදාල ප්‍රාදේශීය කළමණාකරු වෙත දැනුම් දී ප්‍රධාන කාර්යාලයේ පද්ධති නිලධාරී වෙතද දැනුම් දෙමින් එය යථා තත්වයට පත්කර ගැනීම GPS යන්ත්‍රය භාරව සිටින තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීගේ වගකීම වේ. එසේම ඉඩම් මැනීමේ කටයුතු සඳහා GPS යන්ත්‍ර යොදා ගැනීමට නොහැකි වන අවස්ථාවකදී ටේප් පටිය මගින් එම ඉඩම මැණුම් කර අදාල පරීක්ෂණ වාර්තාවේ විශේෂ සටහන් යටතේ GPS යන්ත්‍රය භාවිතා නොකිරීමට හේතුව සඳහන් කිරීම අනිවාර්ය වේ.

මහින්ද විදානපතිරණ
සභාපති

**පිටපත්:**

1. සාමාන්‍යාධිකාරී
2. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන/ව්‍යාප්ති)
3. කළමණාකරු (සංවර්ධන)
4. කළමණාකරු (මානව සම්පත්)
5. කළමණාකරු (මුදල්)
6. අභ්‍යන්තර විගණක
7. සියළුම මාණ්ඩලික නිලධාරීන්
8. සියළුම කාර්යභාර නිලධාරීන්
9. සියළුම තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන්